# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෂ

අංක 2124/10 - 2019 මැයි මස 22 වැනි බදාදා - 2019.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

ශ්‍රී ලංකාවේ හදිසි අවස්ථා තත්ත්වයක් පැවතීම හේතුකොට ගෙන මහජන ආරක්ෂාව සහ රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම හා ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා මෙසේ කිරීම අවස්ථානුකූල යයි මා අදහස් කරන හෙයින්;

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, 1959 අංක 8 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් සංශෝධිත (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඒ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ 2019 ක් වූ මැයි මස 22 වැනි දින සහ ඉන් පසුව ක්‍රියාත්මක විය යුතු යයි මේ ප්‍රකාශනයෙන් ප්‍රකාශ කරමි.

වර්ෂ 2019 ක් වූ මැයි මස 22 වැනි දින කොළඹ දී ප්‍රකාශ කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමා ගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.


1A - G 29928 — 392 (2019/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*